ආසියානු වැඩමුළුව

**IYAFA 2022**- තිරසර හා සමානාත්මතාවයෙන් යුතු සුළුපරිමාණ ධීවර කර්මාන්තය සමරමු

දෙවන සැසිවාරයඃ තිරසර ධීවර කර්මාන්තය, ආහාර සුරක්ෂිතතාවය සහ දිළිඳුකම පිටුදැකීම සඳහා සමාජ සංවර්ධනය

සුළු පරිමාණ ධීවර කර්මාන්ත සංදර්භය තුල සමාජ සංවර්ධනය වැදගත් වනුයේ ධීවර ප්‍රජාවගේ සාමූහික යහ පැවැත්ම සහ සුරක්ෂිත සමාජ සංවර්ධනය තුලින් තිරසර සහ වගකීමක් සහිත ධීවර කලමනාකරණයකට යොමුවිය හැකි බැවිනි. සමාජ ආරක්ෂණය සමාජ සංවර්ධනයේ ප්‍රධාන අංගයක් වන අතර එමගින් අර්බුධකාරී අවස්ථාවන් හිදීත්, ස්වාභාවික ආපදාවන්හිදීත්, ධීවර අර්බුධයන් හිදීත්, නැතහොත් **COVID** 19 වැනි ගෝලීය වසංගත තත්වයන් හිදීත් අතිශය වැදගත් කාර්යය භාරයක් ඉටුකරමින් සහයක් ලබාදේ. සමාජ සංවර්ධන රාමුව සමාජයෙන් කොන්කර නෙරපීම අවම කරන අතර එමගින් සුළුපරිමාණ ධීවර කලමණාකරනය සඳහා පාරිසරික පද්ධතීන් පදනම් කරගත් ක්‍රියාවලියක් සඳහා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීමද අපේක්ෂා කෙරේ. මෙමගින් නිවැරදි ප්‍රතිපත්ති සහ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නේ නම් තිරසර ධීවර කර්මාන්තය සහ ආහාර සුරක්ෂිතතාවයත් ධීවර ප්‍රජාවගේ දරිද්‍රතාව පිටුදැකීමත් සඳහා දායකත්වය ලබාදිය හැකිවනු ඇත.

සුළු පරිමාණ ධීවර කර්මාන්තයේ තිරසර භාවය සුරක්ෂිත කිරීම සඳහා වන මග පෙන්වීම් මාලාවේ සඳහන් පරිදි (සුළු පරිමාණ ධීවර මගපෙන්වීම්) සමාජ සංවර්ධනයේ අන්තර්ගත ප්‍රධාන කරුණු වනුයේඃ

1. දැරිය හැකි මිලකට සෞඛ්‍යය සඳහා ප්‍රවේශයටත්, අධ්‍යාපණය සහ සාක්ෂරතාවය සඳහාත්, නිවාස සහ සනීපාරක්ෂාව, පානීය ජලය සඳහාත්, ඩිජිටල් පහසුකම් සඳහාත්, බල ශක්තිය සඳහාත්, ඉතිරි කිරීම් සහ රක්ෂණය සඳහාත් ආයෝජනය කර, දැරිය හැකි මිලකට ප්‍රවේශය සඳහා පහසුකම් සැපයීම

2. යුක්තිය සඳහා ප්‍රවේශය

3. මහ මුහුදේ දී සහ අභ්‍යන්තර ජලාශයන්හි ක්‍රියාකාරිත්වයේ දී ආරක්ෂාව සඳහා සහ ආපදා කලමනාකරණය සඳහා අවධානය යොමු කිරීම සහ

4. මෙම උප ක්ෂේත්‍රයේ සියළුම ක්‍රියාකාරීන් ගේ වැඩ කටයුතු මනාව පවත්වා ගැනීම සඳහාත් ධීවර ක්ෂේත්‍රයේ ක්‍රියාකාරින්ගේ ශ්‍රමය සඳහා සාධාරණ වැටුපක් ගෙවීම සඳහාත් සහතික වීම. එමෙන්ම ධීවර ප්‍රජාවට සාධාරණ වැටුපක් සඳහා සහ ධීවර කලමනාකරණය සඳහා ප්‍රාග්ධනයක් ආයෝජනය කිරීම.

   සමාජ සාධාරණත්වය පදනම් කරගත් සාධාරණ රැකියාවන් හි මූලිකාංග ලෙස

   - ඵලදායක නිෂ්පාදනය (විධිමත් සහ අවිධිමත්)
   - රැකියාවන්හි දී අයිතීන් සුරක්ෂිත කිරීම
   - සමාජ සහය සහ සමාජ ආරක්ෂණය සහිතව සමාජ සුරක්ෂිතතාව සැලසීම සලකනු ඇත. මෙහි ඇතුලත් වන කරුණු අතර ළමා සහ පවුලට අදාල ප්‍රතිලාභ, මාතෘ ප්‍රතිලාභ, සෞඛ්‍යය ප්‍රතිලාභ, රෝගී තත්වයන්හිදී ප්‍රතිලාභ, රැකියා අවස්ථාවේදී සිදුවන අනතුරු ප්‍රතිලාභ, විරැකියා ප්‍රතිලාභ, වැඩිහිටි ප්‍රතිලාභ සහ ලෝක කම්කරු සංවිධානයේ නිර්දේශයන්ට අනුව ජීවත්වන්නන් සඳහා යෝග්‍ය වන ප්‍රතිලාභ සැලසීම යනාදියයි. සුළුපන්න ධීවර මගපෙන්වීම් මාලාවේ 6.3 පරිච්ඡේදයේ සුළු පන්න ධීවර කාර්මිකයින් සඳහා සමාජ ආරක්ෂණය පිළිබඳව සොයා බලයි.

තිරසර සංවර්ධන ඉලක්ක 14 ට අමතරව ඇති කරුණුද සටහන් කිරීම වටී. තිරසර සංවර්ධනය සඳහා සාගර තිරසරව භාවිතා කිරීම සහ සංරක්ෂණය, බොහොමයක් සමාජ සංවර්ධනයේ අන්තර්ගතයන් තිරසර සංවර්ධන ඉලක්ක තුල ඇතුලත්ය.

මෙහි ඇතුලත් වන කරුණු: ඉලක්ක අංක 1: සැම තැනකම ඇති සියළුම ආකාරයේ දරිද්‍රතාවයන් නිමා කිරීම(මෙය අහඹුවක් ලෙස ඉලක්ක 1.3 හි ජාතික වශයෙන් යෝග්‍ය වන සමාජ ආරක්ෂණ පද්ධතීන් සහ ක්‍රමවේදයන් සියල්ලන්ට සැලසීම)

ඉලක්ක අංක 2: බඩගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාවය ලගාකර ගැනීම සහ පෝෂණය වර්ධනය කිරීම සහ තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

ඉලක්ක අංක 3: සෞඛ්‍යය සම්පන්න ජීවිත සහතික කිරීම සහ සියළුම වයස් සීමාවන්හි පුද්ගලයන්ට යහ පැවැත්ම සහතික කිරීම

ඉලක්ක අංක 4: සියල්ලන්ට ජීවිත කාලය පුරාවටම අධ්‍යාපණ අවස්ථාවන් සහ සියල්ලන්ටම ගුණාත්මක හා සමානාත්මතාවයෙන් යුතු අධ්‍යාපණයක් සහතික කිරීම

ඉලක්ක අංක 5: ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ලගාකර ගැනීම සහ සියළුම කාන්තාවන්ට සහ ගැහැණු දරුවන් බලගැන්වීම

ඉලක්ක අංක 8: තිරසර ආර්ථික වර්ධනය සහ එහි ස්ථාවරත්වයත්, පූර්ණවූ සහ ඵලදායක රැකියාවන් මෙන්ම සාධාරණවූත් රැකියාවන් සියල්ලන්ට සැපයීම සහ

ඉලක්ක අංක 13: දේශගුණික විපර්යාසයන් සහ එහි බලපෑම පිටුදැකීම සඳහා කඩිනම් පියවර ගැනීම

කණ්ඩායම් සාකච්ඡාව සඳහා ප්‍රශ්ණාවලිය

1. ඔබගේ දේශීය හා ජාතික සංදර්භය තුල වෙනත් පුරවැසියන්ට ඇති පරිදිම සෞඛ්‍යය , අධ්‍යාපණය, නිවාස, සනීපාරක්ෂාව, පානීය ජලය සහ බලශක්ති සේවාවන් හා පහසුකම් සුළුපන්න ධීවර ප්‍රජාවන්ගේ කාන්තාවන්ට සහ පුරුෂයින්ට හා දරුවන්ට ලබාගත හැකි මිලකට මෙන්ම ප්‍රමාණවත්ව ලබාගත හැකිද? මෙම සේවාවන් හා පහසුකම් සඳහා ප්‍රවේශය දියුණු කරගත හැක්කේ කෙසේද? මෙම කාර්යයේදී ධීවර පරිපාලන සේවාවන්ට හා ප්‍රජා සංවිධානවලට කල හැකි කාර්යය භාරය ලෙස පෙනී යන්නේ කුමක්ද?

2. සුළුපන්න ධීවර ප්‍රජාවන් සහ සියළුම කම්කරු සාමාජිකයින් ට සමාජ ආරක්ෂණයන් එනම් ආංශික හා විශ්වීය ආකාරයේ (ජාතික මට්ටමේ) සමාජ සහය හෝ සමාජ රක්ෂණ ක්‍රමවේදයන් පවතීද? මේවා ක්‍රියාත්මක කිරීමේදී කාන්තාවන් සංක්‍රමණික කම්කරුවන් වැනි යම් කොටස් වෙත අසාධාරණයන් සිදුවේද?

3. ධීවර ක්ෂේත්‍රය ආශ්‍රිතව මහ මුහුදේදී හෝ මිරිදිය ජලාශයන්හි දී සිදුවන අනතුරු සංඛ්‍යාව ඉහල යාමක් දක්නට ලැබේද? දේශගුණ විපර්යාස නිසා ඇතිවන ආන්තික දේශගුණික තත්වයන් නිසා කරදිය හා අභ්‍යන්තර ධීවර සංධර්භය තුල ආරක්ෂණය පිළිබඳ ගැටළුකාරීත්වයක් දක්නට ලැබේද? ධීවර මෙහෙයුම් වලදී ඇතිවන මෙම තර්ජණ වලට මුහුණදීම සඳහා ගත හැකි ආරක්ෂාකාරී තත්වයන් සමස්ථයක් ලෙස දියුණු කරන්නේ කෙසේද?